# බටහිර දර්ශනයේ ක්‍රමික ව්‍යාප්තිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**ගෝනලගොඩ නන්ද හිමි**

**ප්‍රවේශය**

සියලු විෂයන්ගේ මව් යන විරුදයෙන් ප්‍රකට දර්ශනය පෙරදිග හා බටහිර වශයෙන් අංශද්වයකින් සමන්විතය. තේල්ස් නමැති මෙලේසියානු දාර්ශනිකයාගෙන් ආරම්භ වන බටහිර දර්ශනය විවිධ දාර්ශනිකයන්ගේ දාර්ශනික මැදිහත් වීම මත සමකාලීන යුගය දක්වා ව්‍යාප්ත වේ. මෙම ශාස්ත්‍රීය කාර්යයෙහි ප්‍රධාන අරමුණ වනුයේ තේල්ස්ගෙන් ඇරඹි එකී බටහිර දර්ශනය පිළිබඳ ප්‍රාමාණික හා සංක්ෂිප්ත අධ්‍යයනයක් සිදු කිරීමය. එහිදී බටහිර දර්ශනය හා යුගානුගත ප්‍රභවය පිළිබඳ අධ්‍යයනය කෙරේ.

**සන්දර්භය**

දර්ශනය (Philosophy) යන වචනයට අර්ථකතනාචාර්යවරුන් විවිධ නිර්වචන ඉදිරිපත් කොට ඇත. සිංහල ශබ්දකෝෂයට අනුව ඥානය, ප්‍රඥාව ඒවා සෙවීමට ගන්නා ප්‍රයත්නය, නුවණින් දැකීම යනාදී ලක්ෂණ දර්ශනය යන වචනය තුළ ගැබ්ව පවතී (**හරිස්චන්ද්‍ර, 2006: 891**). එහෙත් Philosophy යන වචනය ග්‍රීක භාෂාවෙන් නිපන්නක් බැවින් ඒ තුළ ඇත්තේ ප්‍රඥාවට ආදරය කිරීම බව (**Greek, love of Knowledge or wisdom (Simon, 2016, 361)** පිළිගත් මතයයි. මේ ආකාරයෙන් හඳුනාගත හැකි දර්ශනයෙහි බටහිර අංශය යුග සතරක් ඔස්සේ වර්ධනය වී ඇත.

ග්‍රීක යුගය

මධ්‍යතන යුගය

නූතන යුගය

සමකාලීන යුගය

මෙලෙස හඳුනාගත හැකි බටහිර දර්ශනය එක් යුගයක පවතින විසංවාදයන් සංවාදයට ගනිමින් නව එළඹුමක් ආකාරයට යුග ඔස්සේ වර්ධනය වී ඇති බව පෙනේ. මෙහි පුරෝගාමියා වශයෙන් හැඳින්වෙන තේල්ස්ගෙන් ග්‍රීක දර්ශනය ආරම්භ වන නමුදු ඔහුට පූර්වයෙන් ද විවිධ චින්තකයන් සිටි බව දැක්වේ. හෝමර් හා හෙසියඩ් එවැනි චින්තකයන් ලෙස හඳුනාගත හැකිමුත් ඔවුන් දාර්ශනිකයන් හා සමානත්වයේ නොගැනේ. මෙමෙලෙසියානු පළමු දාර්ශනිකයා වන තේල්ස් සූර්යග්‍රහණ පිළිබඳව පළමුවෙන් අනාවැකියක් ද ඉදිරිපත් කළේය (**විදානගම, 2011: 345**). එතෙක් සාම්ප්‍රදායික මිථ්‍යා මතයන්ගෙන් ගහණ වූ ලෝකය පිළිබඳ ප්‍රශ්න කිහිපයක් තේල්ස් විමසා ඇත.

1. අපට පෙනෙන්නා වූ විවිධත්වයෙන් යුත් විශ්වයේ යථාර්ථය නම් කුමක්ද?
2. විවිධත්වයෙන් යුත් විශ්වයේ මූල හේතුව නම් කුමක්ද?
3. වශ්වය සම්භවය වූයේ කුමකින්ද? (**කලංසූරිය, 1987: 22**).

යනාදී වශයෙන් ලෝකය පිළිබඳ විමසූ තේල්ස් එයට පිළිතුර ලෙස ඉදිරිපත් කරනුයේ ජලයයි. එලෙස විශ්වයේ මූල හේතුව ජලය වන බවට මතයක් ඉදිරිපත් කිරීමට තේල්ස්ට කරුණු කිහිපයක් ඉවහල් වන්නට ඇති බව ජෝන් බර්නට් දක්වයි.

1. අයෝනියා ප්‍රදේශය ජලයෙන් යටවීම.
2. පොළොව හාරන විට මෙන්ම අහසින් ජලය ලැබීම.
3. සෑම ජීවියෙකුටම ජලය අවශ්‍ය වීම.
4. නයිල් ගංගාව පිටාර ගැලීමෙන් ලබන අත්දැකීම. (**Burnet. 1971: 40**).

ස්වභාවික ලෝකයෙන් ලබන අනුභූතීන් පදනම් කොට ගනිමින් ලෝකය පිළිබඳ යථාර්ථමය වශයෙන් තේල්ස්ට පෙර බටහිර මානවයා චින්තනය කොට නොමැත. එබැවින් සම්ප්‍රදාය අතික්‍රමණය කරමින් අනුභූතිය ඔස්සේ සිත මෙහෙයවා ලෝකය විග්‍රහ කිරීමේ ගෞරවය තේල්ස්ට හිමිවිය යුතුය. මෙලෙස ආරම්භ වන ග්‍රීක දර්ශනය

මෙලේසියානු ගුරුකුලය, ඊලියානු ගුරු කුලය, පරමාණුවාදීන්, විතණ්ඩවාදීන් හා සම්භාව්‍ය දාර්ශනිකයන් යන විවිධ ප්‍රවේශ ඔස්සේ සංවර්ධනය වන්නට විය. ඊට අමතරව එපිකියුරියානුවාදය, ස්ටොයික්වාදය, සංශයවාදය, නව ප්ලතෝනිකවාදය ද ග්‍රීක දර්ශනය වැඩි දියුණු කළ දාර්ශනික අවධීන් ලෙස හඳුනාගත හැකිය (**කලංසූරිය, 1987: 27**).

මෙලෙස විවිධ අනුශාඛාවන්ට ග්‍රීක දර්ශනය විතැන් වීමේ ප්‍රධාන හේතුව වනුයේ එක් මතයක එල්බ නොසිට වෙනස් වෙනස් මත ඉදිරිපත් කිරීමය. පූර්වයෙන් සිටි දාර්ශනිකයාගේ දර්ශනයට ලඝු නොවී යථාර්ථමය ප්‍රපංචයන් සෙවීමට ගත් උත්සාහයේ සාමූහික ප්‍රතිඵලයක් ලෙස ග්‍රීක දර්ශනය පෙන්වා දිය හැකිය. සම්භාව්‍ය දාර්ශනිකයන් වශයෙන් හැඳින්වෙන සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල් ග්‍රීක දර්ශනය වෙනුවෙන් සුවිශේෂී කාර්යභාරයක් සිදු කොට ඇත. එහිදී පූර්ව සොක්‍රටීසියානු දාර්ශනිකයන් ලෝක විභාගයේ යෙදුණ ද සොක්‍රටීස් සිය දර්ශනය කතිකාවෙන් ලෝකය පිළිබඳ විභාගයට පෙර තමා පිළිබඳ දැන ගැනීම වඩා වැදගත් බව අවධාරණය කළහ (**විදානගමගේ, 1997: 32**). මේ ආකාරයෙන් හඳුනාගත හැකි ග්‍රීක දර්ශනයෙහි සුවිශේෂීත්වය වනුයේ තර්කය, දේශපාලනය, අධිභෞතික විද්‍යාව, ආචාර විද්‍යාව, සෞන්දර්ය දර්ශනය ආදි සියලු දාර්ශනික උපවිෂය ක්ෂෙත්‍රයන් අන්තර්ගත වීමය.

ග්‍රීක දර්ශනයෙන් පසුව මධ්‍යයතන දර්ශනය බිහි වන අතර එය දාර්ශනික වශයෙන් පසුගාමී අවධියක් ලෙස හඳුනාගත හැකිය. 5වන සියවසෙහි බිඳ වැටුණ රෝමානු අධිරාජ්‍යයත් 15වන සියවසේ බිහි වූ පුනරුත්ථානයත් අතර කාලයේ වර්ධනය වූ යුරෝපීය දර්ශනය මධ්‍යයතන දාර්ශනික අවධිය වේ. යුරෝපා ඉතිහාසයේ අන්තර්ගත දෙවන යුගය වනුයේ මධ්‍යතන යුගයයි. මධ්‍යතන යුගයට Middle ages යන්න භාවිතාවන අතර එය ''17වන සියවසේ දී යුරෝපා ජාතීන් විසින් ව්‍යවහාර කරන ලදි'' (**යුරෝපා ඉතිහාසය, 2009: 01**). ක්‍රි:ව 500 - 1500 අතර කාලය තුළ මෙකී මධ්‍යතන යුගය විකාශය වන්නට වූ අතර මෙහි බිඳ වැටීමත් සමඟ නූතන යුගය බිහි විය. ක්‍රිස්තුස් වහන්සේගේ පහළ වීමත් සමඟ ඇරඹි මෙකී මධ්‍යතන දර්ශනය ප්‍රධාන වශයෙන් යුග කිහිපයක් ඔස්සේ අධ්‍යයනය කළ හැකිය.

01. මුල් කාලීන මධ්‍යතන යුගය

02. මධ්‍ය කාලීන මධ්‍යතන යුගය

03. පශ්චාත් කාලීන මධ්‍යතන යුගය

මධ්‍යතන දර්ශනය හැඳින්වෙන අන්වර්ථ නාමයන් කිහිපයක් පවතින අතර පල්ලියේ දර්ශනය, කතෝලික දර්ශනය යනු ඉන් සමහරෙකි. ''එයට හේතුව වනුයේ යේසුස් වහන්සේගේ ආගමනයත් සමඟ කතෝලික පල්ලිය කේන්ද්‍ර කර ගනිමින් සමාජය විකාශනය වීමයි'' (**විදානගම, 2009: 02**). ජේරුසුලම අසල බෙත්ලෙහෙම නම් ග්‍රාමයේ දී යේසුස් වහන්සේ උපත ලදහ. එකල දූෂිත පාලනයක් පැවති බැවින් සාමන්‍ය ජනයා සාමයේ කුමරු පැමිණෙන තෙක් බලා සිටියහ. ඉන් අනතුරුව යේසුතුමා ඥාතියෙකු වූ ජෝන් බැප්ලිස්ට් සමීපයේ හිඳ භෞතීස්ම වීමෙන් පසුව වයස 25 දී සංචාරක දේශකයෙකු වෙමින් තම අදහස් සමාජ ගත කළහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් මධ්‍යතන දර්ශනය බිහි වූ අතර එය ක්‍රි:ව 1500 දක්වා විහිදී ගියේය (**රසල්, 1970: 345**).

මධ්‍යතන දර්ශනය ග්‍රීක හා රෝම සංස්කෘති ගවේශණය කිරීමේ ක්‍රියාවලියක් ලෙස හඳුනාගත හැකිය. එලෙස හඳුන්වනුයේ විවිධ පාලකයන්ගෙන් තැලී පෙලී සිටි සමාජය ඉන් ගලවා ගැනීමේ ක්‍රියාවලියක් ඒ තුළ අන්තර්ගත වී පැවතීමය. තවද මධ්‍යතන යුගය ආබ්‍රහමික ආගම්වල සම්භාව්‍ය අවධියක් වශයෙන් ද හඳුන්වනු ලැබේ (**මෙන්දිස්, 2007: 23**). එලෙස හැඳින්වීමට හේතුව වනුයේ දේවවාදී ආගමික ඉගැන්වීම් මධ්‍යතන යුගය තුළ බලාධිපත්‍ය හිමි කර ගැනීමය. මෙම අවධියෙහි ප්‍රධාන ඉගැන්වීම වනුයේ ක්‍රිස්තියානි දේවවාදයයි. මෙහි නායකයා වන ජේසුතුමා සංචාරක ජීවිතයක් ගත කරමින් දේශන සිදු කළහ. එම දේශනාවන්ගේ ''ප්‍රධාන සංකල්පයන් වනුයේ ආදරය, සාධාරණය, කරුණාව යන සංකල්පයන් ය'' (**පඤ්ඤාකිත්ති හිමි, 2003: 13**). මෙයින් යේසුතුමා අපේක්ෂා කරන ලද්දේ දූෂිතව පැවති සමාජය යහපත් කිරීම විය හැකිය. එහෙත් එම දේශනාවන්ගේ ප්‍රධාන පරමාර්ථය වූයේ දෙවියන් වහන්සේ විශ්වාස කිරීමය. මෙකී මධ්‍යතන දර්ශන යුගය දාර්ශනික වශයෙන් අඳුරු යුගයක් වශයෙන්

හඳුන්වනු ලැබේ. ඊට බලපෑ ප්‍රධාන හේතුව වනුයේ දාර්ශනික වශයෙන් සමාජයට ආලෝකයක් නොලැබීමයි. එනම් දාර්ශනික අදහස් හෙවත් සංකල්ප සමාජ ගත නොවීමයි.

මධ්‍යතන දර්ශනයේ ආරම්භය හා විකාශය මෙන්ම සංවර්ධනය පිළිබඳ විවිධ මත දැකිය හැකිය. ඉන් එක් මතයක් වනුයේ මෙම මධ්‍යතන දර්ශනය යුදෙව් ආගමෙන් බිඳී ආවක් බවය. ඊට හේතුව ලෙස සැලකෙනුයේ යුදෙව් ආගමේ ඇතැම් අංග ක්‍රිස්තු ධර්මය තුළ තිබීමයි. ''නිදසුනක් ලෙස මෙඩිය වහන්සේ ලොව ගැලවුම්කරු ලෙස පැමිණියේය'' යන සංකල්පය පෙන්වා දිය හැකිය (**විමලරත්න, 2014: 81**). එසේම මෙකී මධ්‍යතන දර්ශනය පිළිබඳ පවත්නා තවත් මතයක් වනුයේ ''මුලදී ක්‍රිස්තු ධර්මයේ කිසියම් දර්ශනයක් නොවීය. නමුත් පසුව ඔවුනගේ අනුගාමිකයන් අතර ග්‍රීක හා රෝම ලේ මිශ්‍ර වීම නිසා දාර්ශනික බුද්ධිය උදාවිය'' යන්නයි (**පඤ්ඤාකිත්ති හිමි, 2003: 13**). ඒ අනුව ප්‍රකට වනුයේ මධ්‍යතන දර්ශනය යනු ශුද්ධ වූ නව දර්ශනයක් නොවන බවයි. ඊට හේතුව වනුයේ ග්‍රීක හා රෝම ලේ මිශ්‍ර වීම නිසා ක්‍රිස්තියානි චින්තනය බිහි වී තිබීමයි. එබැවින් මධ්‍යතන යුගය යනු ස්වෛරී දර්ශනයක් හෝ ශුද්ධ දර්ශනයක් නොවේ යැයි සිතිය හැකිය. මේ ආකාරයට විකාශය වූ මධ්‍යතන යුගය ක්‍රමිකව සමාජගත විය. එහිදී ක්‍රිස්තු දර්ශනය සමාජගත වීමත් සමඟ පැවති අඩු ලුහුඬුකම් තරමක් දුරට හෝ මග හරවා ගනිමින් මධ්‍යතන දර්ශනය සාධනීය මට්ටමකට පැමිණ වීමටශාන්ත ඔගස්ටීන් (ක්‍රි.ව. 354 - 430)

ශාන්ත ඇන්ස්ලම් (ක්‍රි.ව. 1033 - 1109)

ශන්ත තෝමස් ඇක්වයිනාස් (ක්‍රි.ව. 1225 - 1274)

යන චින්තකයන් සමත් වී තිබේ. එහෙත් ශාන්ත තෝමස් ඇක්වයිනාස් සඳහන් කරන ලද්දේ තමා දාර්ශනිකයෙකු නොවන බවයි. එසේම මොහු දාර්ශනිකයන් විවේචනය කොට ඇත. ඊට හේතුව වනුයේ මොවුන් පූජකයන් වීමය. එසේම දර්ශනයෙන් කිසි සත්‍යයක් සොයා ගත නොහැකි බව සඳහන් කොට ඇත. එහෙත් ගැටලුව වනුයේ දර්ශනය යනු සත්‍ය මතු කරනා දෙයක් නොවීමයි. සමාජයට ගැටලු මතු කරනා දෙයක් වීමය. ප්‍රශ්න නගමින් එම ගැටලුව ලෝකයාගේ අවධානයට යොමු කිරීම දර්ශනයේ ස්භාවයයි.

එබැවින් දර්ශනයෙන් කුඩා නොව විශාල සත්‍යයක් වුව ද අනාවරණය කිරීමට යෝග්‍ය වන්නේ නැත. ඊට හේතුව වනුයේ දර්ශනය යනු නව ප්‍රශ්න නඟමින් ඉදිරියට යන්නා වූ විෂයක් බැවිනි. එසේම දර්ශනය යනු විද්‍යාගාර තුළ විද්‍යාත්මක පර්යේෂණ කරමින් නිගමනයන්වලට එල්බ ගන්නා විෂයක් ද නොවේ. එබැවින් දාර්ශනිකයන් නගන ප්‍රශ්නවලට දාර්ශනිකයන් නිගමනයන් දුන්න ද ඒවා සියල්ල සත්‍ය වූ විද්‍යාත්මක නිගමනයන් නොවේ. එබැවින් දර්ශනයෙන් කුඩා සත්‍යයක් වුව අනාවරණය කළ නොහැකිය යන ඇක්වයිනාස්ගේ ප්‍රකාශය නිශේධනය වනු ඇත. උක්ත චින්තකයන් තිදෙනාට අමතරව මධ්‍යතන යුගයේදී විවිධ චින්තකයන් සිටිය නමුදු මොවුන් ත්‍රිත්වය සුවිශේෂී වනුයේ දර්ශනය හා සමගාමීව තර්ක ශාස්ත්‍රය ඔස්සේ තම ප්‍රකාශ ඉදිරිපත් කිරීම නිසා ය.

මූල හේතුක තර්කය

සද්භාව තර්කය

සාධ්‍යතා තර්කය

වැනි තර්ක උපයෝගී කර ගනිමින් දෙවියන් වහන්සේගේ පැවැත්ම තහවුරු කිරීම සිදුකොට තිබේ. එසේම මොවුන්ගේ මූලිකත්වයෙන් අධ්‍යාපන මධ්‍යස්ථාන බිහිවිය. අඳුරු යුගයක්ව පැවති මධ්‍යතන දර්ශනය යම්තාක් දුරට ආලෝකය වෙත රැගෙන යාමේ මාවත මොවුන් විසින් විවර කරන්නට විය. මේ ආකාරයට මධ්‍යතන දර්ශනය පිළිබඳ හැඳින ගත හැකි අතර මධ්‍යතන දර්ශනය ක්‍රිː ව 1500 දී අවසන් විය.

මධ්‍යතන දර්ශනය ග්‍රීක දර්ශනයෙන් පසුව එළඹී බැවින් මෙම යුගයන් දෙක අතර යම් යම් විෂමතාවන් මෙන්ම සමතාවන් ද දැකිය හැකිය. එහෙත් මධ්‍ය කාලීන බටහිර දර්ශනය නම් කෘතියේ දී සංජීව මෙන්දිස් දක්වා ඇත්තේ 'මධ්‍යකාලීන බටහිර දර්ශනය අවබෝධ කරගත යුත්තේ ස්වාධීන එක් දාර්ශනික යුගයක් වශයෙන් විනා තවත් යුගයකට හෝ දාර්ශනිකයෙකුට හෝ සම්ප්‍රදායකට නැතහොත් පෙරදිග දර්ශනයේ විමර්ශනයන්ට සාපේක්ෂව නොවේ' **(මෙන්දිස්, 2007ː 24)** යනුවෙනි. එහෙත් ග්‍රීක දර්ශනයේ ආභාසය මධ්‍යතන දර්ශනය වෙත ලැබී ඇති බව පැහැදිලි කරුණකි.

මධ්‍යතන දර්ශනයෙන් පසුව දර්ශන ඉතිහාසය තුළ බිහිවන දාර්ශනික අවධිය නූතන බටහිර දර්ශනය වේ. නූතන බටහිර දර්ශනයේ පියා වශයෙන් හැඳින්වෙනුයේ රෙනේ ඩේකාට්ය. මොහු ක්‍රි.ව. 1596- 1650 අතර ජීවත් වූ දාර්ශනිකයෙකි. නූතන බටහිර දර්ශනයේ පියා වශයෙන් ඩේකාට් හැඳින්වීමට ප්‍රධාන හේතුව වනුයේ පැවති ආදානග්‍රාහී ගතිකත්වයෙන් මිදී දර්ශනය දර්ශනයක් සේ සලකමින් නව විප්ලවකාරී අදහස් සමාජගත කිරීම හේතුවෙනි. 17 සියවසේ සිට සමකාලීන යුගය දක්වා එනම් දහනව වන සියවසේ අග හා විසිවන සියවසේ මුල දක්වා වූ කාලය නූතන දාර්ශනික අවධිය සේ දළ වශයෙන් සලකනු ලැබේ. **(The 17th and early 20th centuries roughly mark the beginning and the end of modern philosophy) ^https://en.wikipedia.org/wiki/Modern_philosophy 2020)**. මෙහිදී මධ්‍යතන දර්ශනයෙන් නූතන යුගය බිහි වීම දක්වා වූ අතර කාලය පුනරුදය (Renaissance) ලෙස හැඳින් වේ. The Renaissance was a period in European history marking the transition from the Middle Ages to Modernity and covering the 15th and 16th centuries **(https://en.wikipedia.org/wiki/Renaissance 2020)**.

විද්‍යාත්මක පුනරුදයේ හා ආගමික ප්‍රතිසංස්කරණයේ නව්‍ය පිබිදීම සමඟ වර්ධනය **(ධම්මානන්ද හිමි, 2016: 77)** වූ නූතන බටහිර දර්ශනය ක්‍රිස්තියානි පල්ලියේ පැවති විශ්වාස කිරීම පරම න්‍යාය වශයෙන් පිළිගැණුන සම්මතය අභියෝගයට ලක් කරමින් විද්‍යාත්මක ඇසින් ලෝකය දෙස බලන්නට හුරු කරනු ලැබීය. එකල පල්ලිය විසින් පිළිගැණුන පෘථිවි කෙන්ද්‍රවාදය වෙනුවට සූර්ය කේන්ද්‍රවාදය ඉදිරිපත් කිරීම, දුරේක්ෂය සොයා ගැනීමත් සමඟ එය තහවුරු වීම වැනි විද්‍යාවේ නව පිබිදීම් සිදු වීම මෙහි කැපීපෙනෙන ලක්ෂණයක් ලෙස පෙන්වා දිය හැකිය. නමුත් විද්‍යාවේ වර්ධනය හෙවත් දැනුමේ පිබිදීම පල්ලිය පිළිනොගත් අතර එයට විරුද්ධව සිය බලය ව්‍යාප්ත කළ බව ද දැකිය හැකි කරුණකි **(රසල්, 1970, 534)**. නූතන බටහිර දර්ශනය නියෝජනය කරමින් දාර්ශනික මතවාද කිහිපයක් සමාජගත විණි. බුද්ධිවාදය හා අනුභූතිවාදය වශයෙන් හැඳින්වෙනුයේ එම දාර්ශනික නියෝජනයන්හි සුවිශේෂී මතුවීමකි. මාර්ටින් ලූතර්, ජෝන් කැල්වින්, ජෝන් නොක්ස් හා උල්රිච් ස්වින්ග්ලි වැනි නූතන බටහිර චින්තකයන් එතෙක් පැවති පල්ලියේ ආධිපත්‍යට විරුද්ධව ක්‍රියා

කරමින් ක්‍රිස්තියානි ආගම නව පදනමකින් හඳුන්වා දීමට කටයුතු කිරීම ද නූතන දර්ශනයේ ආරම්භයත් සමඟ ඇති වූ නව්‍යතාවක් සේ පෙන්වා දිය හැකිය **(කලංසූරිය, 2007: 13).**

එසේම විද්‍යාවේ දර්ශනය ආරම්භවනුයේ ද මෙම කාල වකවානුවේය. (කොපනිකන් විපලවය) නිකලස් කොපනිකස්, කෙප්ලර්, ගැලීලියෝ ගැලීලි, විලියම් හාර්වි, වැනි චින්තකයන් සිය විද්‍යාත්මක ඥානය ඔස්සේ ලෝකය දෙස යථාරූපීව විස්තර කිරීම හා විද්‍යාත්මක නිපැයුම් සොයා ගැනීම මෙහි වර්ධනීය අවස්ථාවක් වේ. නමුත් නූතන බටහිර දර්ශනය දාර්ශනික ලෙස කොටස් දෙකකට බෙදී තර්ක කළ බවක් පෙනේ. බුද්ධිවාදීන් හා අනුභූතිවාදීන් වශයෙන් එකිනෙකාට තර්ක කරමින් ස්ව මතය සාධනය කරනු වස් සිය චින්තනය මෙහෙය වූ බවක් දැකිය හැකිය. මෙහිදී බුද්ධිවාදීන් මූලාකෘතිවාදීන් ලෙස හා අනුභූතිවාදීන් බාහිරාකෘතිවාදීන් ලෙස දර්ශන විචාරකයන් හඳුන්වා ඇත **(වීරසිංහ, 1988, 19).** බුද්ධිවාදීන් වශයෙන් හැඳින්වෙන දාර්ශනිකයෝ තිදෙනෙක් වෙති.

රෙනේ ඩේකාට් (ක්‍රි.ව. 1596-1650)

බෙනඩික්ට් ස්පිනෝසා (ක්‍රි.ව. 1632-1677)

විල්හෙල්ම් ගොට්ෆ්‍රීඩ් ලයිබ්නිට්ස් (ක්‍රි.ව. 1644-1716)

බුද්ධිවාදී දාර්ශනිකයන්ගේ ස්වභාවය වනුයේ ලෝකය බුද්ධිමය පදනමක සිට විග්‍රහ කිරීමය. ඒ අනුව බුද්ධිවාදීහු දක්වනුයේ තාර්කික බව සියල්ලෙහි වස්තු මූලය විය යුතු බවයි. මෙකී බුද්ධිවාදී කතිකාවෙහි ආරම්භය රෙනේ ඩේකාට් විසින් ඇති කරණ ලදී. බුද්ධිවාදීන් සත්‍ය අසත්‍යතාව බුද්ධිමය සංකල්පයක් මත විනිශ්චය කිරීම හා සත්‍යෙක්ෂණීය සංධාරය නොසලකා හැරීම සිදු කොට ඇති බව හඳුනාගත හැකිය. පූර්වයෙන් පැවති ඒකාධිපති හා ආධානග්‍රාහී පල්ලියේ ක්‍රමවේදය ප්‍රතික්ෂේප කිරීම මෙහි මූලික අරමුණ වී ඇත. විස්වාස කිරීම පරම න්‍යාය වශයෙන් භාවිත කළ රීතිය අභියෝගයට ලක් කරමින් බුද්ධිමය හෙවත් තාර්කික පදනමක සිට විස්තර කළ යුතු බව මොවුන් විසින් අවධාරණය කැන ලදී. එලෙස තාර්කික පදනමක සිට විග්‍රහ කළ යුතු බව දැක්වීමට මූලික හේතුව වනුයේ ඒ තුළ පැහැදිලි බවක් අන්තර්ගත වීමය. ප්‍රබල බුද්ධිවාදියෙකු

වන ලයිබ්නිට්ස් ඉදිරිපත් කරණ ලද තන්මාත්‍ර (MONADS) තුළින් ඒ බව මනාව ගම්‍ය කළ හැකි වේ.

එහෙත් බුද්ධිවාදී ව්‍යාපෘතිය තුළ තර්කයට ප්‍රමුඛස්ථානය දීම අවශ්‍ය සාධකය සේ භාවිත කළ ද පැවති සම්ප්‍රදායෙන් පූර්ණ වශයෙන් වියුක්ත වීමට හැකියාවක් ලැබී නොමැති බව කරුණු අධ්‍යයනයෙන් තහවුරු කළ හැකිය. ආකෘතික වශයෙන් නවතාවක් ප්‍රකට කළ ද අන්තර්ගතයෙන් නැවත සිටි තැනටම ගියාක් මෙන් පෙනී යන්නේ වක්‍රෝත්තියෙන් දේව සංකල්පය මොවුන් පිළිගෙන ඇති බැවිනි (**ධම්මානන්ද හිමි, 2016: 91**). බුද්ධිවාදීන් නව සංකල්ප භාවිත කළ ද දේවවාදී සංකල්පයන්ගෙන් විතැන් වීමට නොහැකි වූ බැවින් සියලු විචාරයන් අවසානයේ දෙවියන් වහන්සේ සමීපයේ තිත තැබීමට ඔවුන්ට සිදු වී ඇත. නි. ලයිබ්නිට්ස්ගේ තන්මාත්‍ර ගත්ත ද එකී තන්මාත්‍ර විනාශ කිරීමේ හැකියාව ඇත්තේ දෙවියන්ට පමණක් බව දක්වා තිබීමෙන් එය මනාව තහවුරු කළ හැකිය. මෙම බුද්ධිවාදී ව්‍යාපෘතිය ප්‍රතික්ෂේප කරමින් බුද්ධිවාදීහු සමඟ තර්ක කළ පිරිසක් නූතන බටහිර දර්ශනයේ හමු වේ. ඔවුහු අනුභූතිවාදීහු වෙති.

ජෝන් ලොක් (ක්‍රි.ව. 1632-1714)

ජෝර්ජ් බාර්ක්ලේ (ක්‍රි.ව. 1685-1753)

ඩේවිඩ් හ්‍යුම් (ක්‍රි.ව. 1711-1776)

බ්‍රිතාන්‍ය අනුභූතිවාදීන් වශයෙන් දර්ශන විෂයෙහි සාකච්ඡා කෙරෙන මෙම දාර්ශනිකයන්ගේ විධික්‍රමය වනුයේ අනුභූතිය නොහොත් ප්‍රත්‍යක්ෂය සියල්ලට මුල්වන බවය. පූර්වයෙන් සාකච්ඡා කළ බුද්ධිවාදීහු බුද්ධියට ප්‍රමුඛස්ථානය ලබා දුන්න ද අනුභූතිවාදීහු ප්‍රත්‍යක්ෂයට ප්‍රමුඛස්ථානය දී කටයුතු කොට ඇත. පුද්ගලයා දැනුම සම්ප්‍රජානනයෙහිලා උපකාරී කරගනුයේ අත්දැකීම් බව මොවුන් අවධාරණය කරනු ලැබේ. ජෝන් ලොක්ට අනුව අපගේ මනස කිසිඳු කිලුටක් නැති සුදු කඩදාසියකි. එය විවිධ මෝස්තරයන්හි විවිධාකාර චිත්‍රවලින් පිරී යයි. මනසට පිවිසෙන මේ චිත්‍ර වැනි අදහස් ලැබෙන්නේ කොහෙන්ද? මම එයට තනි පිළිතුරක් දෙමි. එනම් 'අත්දැකීම්වලින්' යනුවෙනි (**ජයතිලක, 2009: 174**).

මේ ආකාරයට බුද්ධිවාදීන්ගේ න්‍යාය (සහජ සංකල්ප) ප්‍රතික්ෂේප කරමින් ලොක් සඳහන් කරනුයේ පුද්ගලයාගේ මනස (උපතත් සමඟ) හිස් සුදු පුවරුවක් (කඩදාසියක්) හා සමාන බවයි. එකී සුදු පුවරුව සංජානනයන් නොහොත් අත්දැකීම් මගින් වර්ණවත් වන බව දක්වා ඇත. දැනුම ලබා ගන්නේ බාහිර ලෝකය හා සමඟ කරන ගනුදෙනුවලින් බව මොහු දක්වයි. එය වැඩි දුරටත් විග්‍රහ කරන බාර්ක්ලේ දක්වනුයේ 'මට ප්‍රත්‍යක්ෂ නොවන විට හෝ මාගේ මනසෙහි නොපවතින විට හෝ දෙවියන්ගේ මනසෙහි නොපවතින විට හෝ යමකට කිසිම පැවත්මක් නොමැත' යනුවෙනි **(විදානග මගේ, 1997: 44)**. බාක්ලේගේ විග්‍රහයෙන් තහවුරු වනුයේ ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයෙන් තොරව වස්තූන්ට පැවත්මක් නොමැති බවයි. එහෙත් බාක්ලේගේ ප්‍රකාශයෙන් ද දෙවියන් වහන්සේගේ ආධිපත්‍යයෙන් ගැලවීමට ඔහුට හැකියාවක් ලැබී නොමැති බව ගම්‍ය වේ. එහෙත් පූර්ණ අනුභූතිවාදියෙකු සේ සැලකිය හැකි හ්‍යූම් සඳහන් කරන ලද්දේ ද්‍රව්‍ය වස්තූන්ගේ පැවත්ම මෙන්ම දෙවියන් වැනි සංකල්ප ද පිළිගත නොහැකි බවයි.

සියලු ඥානය ප්‍රත්‍යක්ෂය ඔස්සේ වර්ධනය වන බව පෙන්වා දුන් අනුභූතිවාදය සම්බන්ධයෙන් හටගන්නා ප්‍රබල ගැටලුවක් වනුයේ සතුට, දුක වැනි සංකල්ප ඉන්ද්‍රිය අනුභූතියෙන් කෙසේ ලබාගන්නේ ද යන්නය. මෙකී බුද්ධිවාදය හා අනුභූතිවාදය ඉමානුවෙල් කාන්ට් විසින් නිවැරදිව විග්‍රහ කොට දැනුම ලබා ගන්නා ආකාරයට මෙම ද්විත්වයම හේතුවන බව දක්වා ඇත. සංවේද්‍යතා පසුබිම හා අවබෝධනීය පසුබිම යන සංකල්ප මගින් දැනුම බිහිවන ආකාරය කාන්ටියානු විශ්ලේෂණයෙහි දැකිය හැකිය **(අභයවංස, 1997, 56)**. නූතන බටහිර දාර්ශනික අවධිය දහනවවන සියවසෙහි අග හා විසිවන සියවසේ මුල දක්වා පැතිරෙන අතර සමකාලීන දාර්ශනික යුගය බිහිවනුයේ ඉන් අනතුරුවය. සමකාලීන දර්ශනය දහනව වන සියවසේ අග හා විසිවන සියවසේ මුල ආරම්භ විය. එහෙත් සමකාලීන දර්ශනය කුමන රටක, කුමන කාලයක ඇරඹුණේ ද යන්න පිළිබඳ පැහැදිලි නිර්වචනයක් නොමැත **(කලංසූරිය, 1987: 57)**. ප්‍රංශය, ජර්මනිය, බ්‍රිතාන්‍ය වැනි රටවල් කේන්ද්‍ර කොටගෙන සමකාලීන චින්තනයන් විර්ධනය වී තිබේ. විවිධ දාර්ශනික තේමා පදනම් කොට ගනිමින් සමකාලීන දර්ශනය සම්ප්‍රදායන් කිහිපයක් ඔස්සේ වර්ධනය වී ඇත.

තාර්කික අණුවාදය

තර්කානුසාරී යථානුභූතවාදය

භාෂාමය දර්ශනය

සාංදෘෂ්ටික වාදය

මාක්ස් වාදය

ප්‍රපංච වාදය

උපයෝගිතාවාදය (**එදිරිසිංහ, 2001: 12-13**)

මේ ආකාරයට හඳුනාගත හැකි දාර්ශනික විභේදනයන්ගෙන් සමකාලීන විශ්ලේෂී දර්ශනය යනුවෙන් නව සම්ප්‍රදායක් ද පවතින බැව් දැකිය හැකිය. දාර්ශනිකයා අධිභෞතික පද්ධතිවලින් බැහැර විය යුතු බව විශ්ලේෂී දාර්ශනිකයෝ අවධාරණය කළහ. එකී විශ්ලේෂී දාර්ශනික කුලකයට අයත් දාර්ශනික ධාරා වනුයේ තර්කානුසාරී අණුවාදය, ඇත විට්ගන්ස්ටෛනියානු තර්කාණුසාරී අණුවාදය, මෑත විට්ගන්ස්ටෛනියානු භාෂාමය දර්ශනය, තර්කානුසාරී යථානුභූතවාදය, සමකාලීන ප්‍රත්‍යක්ෂමය දර්ශනය යන දාර්ශනික ධාරාවන් වේ (**වීරවර්ධන, 2008: 335**). සමකාලීන දාර්ශනිකයන්ගේ මූලික ඉගැන්වීම් දෙස අවධානය යොමුකළ පසු තහවුරු වනුයේ කිසියම් ස්වාධීන බවක් එහි පවතින බවයි. විශේෂයෙන් ආරම්භක දර්ශනයක් වන තාර්කික අණුවාදය ගත්කල එය පැවති මතවාදයන්ගෙන් වෙනස්ව යමින් යම් විවෘත බවකින් යුක්තව වර්ධනය වී ඇති බවක් පෙනේ. ඒ අනුව බලන කල සමකාලීන දර්ශනයෙහි වර්ධනයට ප්‍රධාන කරුණු ද්විත්වයක් බලපා ඇති බව පැහැදිලි වේ.

විද්‍යාවේ වර්ධනය

ගණිතයෙහි බලපෑම

බටහිර දර්ශනය මධ්‍යකාලීන යුගයෙන් පසුව යම් වෙනසකට බඳුන් වූ බව පැහැදිලි කරුණකි. ආධනග්‍රාහී බව වෙනුවට සැක කිරීම ප්‍රධාන රීතිය කරගනිමින් ව්‍යාප්ත වූ නූතන බටහිර දර්ශනය විද්‍යාවට හා නව නිපැයුම්වලට ප්‍රමුඛස්ථානයක් ලබා දී කටයුතු කොට ඇති ආකාරය නූතන දර්ශනයෙහි කැපී පෙනෙන සිදුවීමක් වේ. එකී

විද්‍යා නැඹුරුව තදින්ම බලපාන ලද්දේ සමකාලීන දර්ශනයට බව හඳුනාගත හැකිය. ඒ අනුව සමකාලීන දර්ශනයේ උදාව ඇතිවන කාලයෙහි දර්ශන විෂය ද විශ්වවිද්‍යාල ඉගැන්වීමට පමණක් භාවිත විය. එයට හේතුව වනුයේ විද්‍යා නැඹුරුවයි. මෙකී විද්‍යා නැඹුරුව පාදක කර ගනිමින් දර්ශනය ද විද්‍යාව ඔස්සේ විග්‍රහ කළ යුතු බවට නව මතයක් ඇති විය. එහි ප්‍රතිඵලය වනුයේ විද්‍යාවේ භාවිත විධික්‍රම මගින් දර්ශනය හැඩගැසිය යුතුය යන මතය ඉදිරිපත් වීමය. සියල්ල කුඩා අණුව දක්වා විභජනය කළ යුතු බව රසල් දැක් වූ අතර එමගින් දර්ශනයෙහි ප්‍රධාන තේමාවන් ලෙස පැවති ආචාරවාදී කියමන්, අධිභෞතික කියමන්, ආගමික කියමන්, සෞන්දර්යාත්මක කියමන් යනාදිය ප්‍රතික්ෂේප වීමක් ද සිදු විය. සමකාලීන භාෂාමය දර්ශනය වර්ධනය වනුයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. රසල්ගේ ගෝලයෙකු වශයෙන් හඳුනාගත හැකි විට්ගන්ස්ටෛන් ස්වභාවික භාෂාව වෙනුවට න-ස්වභාවික භාෂාවක් අවශ්‍ය බව යෝජනා කරමින් ට්‍රැක්ටේටස් (Tractatus Logico-Philosophicus) කෘතිය රචනා කළේය. එහෙත් පශ්චාත් කාලීනව විට්ගන්ස්ටෛන් විසින් අවධාරණය කරණ ලද්දේ පවත්නා ස්වභාවික භාෂාව ප්‍රමාණ බවත් න-ස්වභාවික භාෂාවක් අවශ්‍ය නොමැති බවය. එකී මතය විට්ගත්ස්ටෛන් විසින් මතු කරන ලද්දේ (Philosophical Investigations) කෘතියේය. මෙම කෘති පදනම් කර ගනිමින් ඈත විට්ගන්ස්ටෛන් හා මෑත විට්ගන්ස්ටෛන් යන අන්වර්ථ නාම ද විට්ගන්ස්ටෛන් විෂයෙහි භාවිත කරන්නට විය. මෙම කෘති ද්විත්වයෙහි දැකිය හැකි ප්‍රධාන ලක්ෂණය වනුයේ පූර්වයෙන් දැක් වූ අදහස් රචකයා විසින්ම ප්‍රතික්ෂේප කිරීමය. දාර්ශනික විමර්ශන නම් කෘතියෙන් භාෂාමය ක්‍රීඩාව නම් සංකල්පය සමාජගත කොට ඇත. එහිදී ස්වභාවික භාෂාව අනුසාරයෙන් සිදුවන අපගේ බුද්ධි වර්ගීකරණයට විරුද්ධව කෙරෙන අරගලය දර්ශනය වන බව විට්ගන්ස්ටෛන් පෙන්වා දේ **(Wittgenstein 1953: T. 47)**.

විශ්ලේෂී දාර්ශනික ව්‍යාපෘතියට අමතරව මහද්විපික දර්ශනය යනුවෙන් තවත් දාර්ශනික ව්‍යාපෘතියක් ආරම්භ විය. මහද්වීපික යන්න දේශගුණික හෝ ස්වභාවික පාරිසරික සාධක පදනම් කොට ගනිමින් බිහි වූවක් නොව දාර්ශනික අදහස්හි සුසංයෝගය මත බිහි වූවකි. මේ ආකාරයට කෙටියෙන් හඳුනාගත හැකි සමකාලීන දර්ශනය විවිධ දාර්ශනික තේමා පාදක කොට ගනිමින් ව්‍යාප්ත වී ඇත. නමුත් ග්‍රීක

යුගයෙන් ඇරඹී බටහිර දර්ශනය සමකාලීන යුගය වෙත එළඹීමත් සමඟ විවිධ විපර්යාසයන්ට ලක්ව සංශෝධනය වෙමින් ව්‍යාප්ත වී ඇති බව පෙන්වා දිය හැකිය.

ග්‍රීක අවධිය - විශ්ව සම්භවය, මිනිස් හැසිරීම හා සදාචාරය

මධ්‍යතන අවධිය - භක්ති මාර්ගය, දෙවියන්ගේ පැවත්ම, ආගම

නූතන අවධිය - මිනිස් ඥානය සම්බන්ධ ගැටලු

සමකාලීන අවධිය - අර්ථය විශ්ලේෂණය හා මිනිස් ගැටලු **(එදිරිසිංහ, 2001: 13).**

යන තේමාවන් ප්‍රමුඛ කොට දර්ශනය ව්‍යාප්ත වී ඇති බව හඳුනාගත හැකිය. එහෙත් සමස්තයක් වශයෙන් ගෙන සලකන කළ ග්‍රීක දාර්ශනික අවධිය සුවිශේෂී වේ. ග්‍රීක දර්ශනය විශාල පැතිකඩක් ආවරණය වන ආකාරයෙන් ව්‍යාප්ත වී ඇති බව පෙනේ. ඇතැම් විට ග්‍රීක දාර්ශනික චින්තාවන්ගේ ප්‍රධාන විග්‍රයන් පාරප්‍රාප්ත වනුයේ නූතන දර්ශනයේය. තේල්ස්, ඇනැක්සිමැන්ඩර්, ඇනැක්සිමිනීස්, ඇනැක්සිගෝරාස්, හෙරක්ලීටස්, එම්පිඩොක්ලිස්, ඇරිස්ටාකස්, ඉයුඩොක්සස්, ඉරෝස්ටෝතීනිස් වැන්නන්ගේ සංකල්ප එයට නිදසුන් වේ. සූර්ය ග්‍රහණ සම්බන්ධයෙන් තේල්ස් අදහසක් ඉදිරිපත් කොට ඇත්තේ ක්‍රි.පූ 06වන සියවසේය. එසේම සූර්යකේන්ද්‍රවාදය ද ඉදිරිපත් කොට ඇත්තේ ග්‍රීක යුගයේය. ඒ අනුව ග්‍රීක යුගයේ සාධනීය තත්වයක පැවති දාර්ශනික ව්‍යාපෘතිය මධ්‍යතන අවධියේ දී යම් පසුබෑමකට ලක්ව ඇත. එය නැවත නූතන යුගයෙන් ආරම්භ වුව ද මනාව වර්ධනය වනුයේ සමකාලීන අවධියේය.

**සමාලෝචනය**

සමස්ත බටහිර දර්ශනය ප්‍රධාන තේමා කිහිපයකට ගොණු කළ හැකි වේ. ඥාන විභාගය, අධිභෞතික විද්‍යාව, ආචාර විද්‍යාව, තර්ක ශාස්ත්‍රය, සෞන්දර්ය දර්ශනය, දේශපාලන දර්ශනය, භාෂාමය දර්ශනය ආදි තේමාවන් යටතේ දර්ශන විෂය අධ්‍යයනයට ලක් කළ හැකිය. ක්‍රි.පූ 06වන සියවසෙන් ආරම්භ වී සමකාලීන අවධිය දක්වා දිවෙන දර්ශන විෂය සියලු විෂයන්ගේ මව් යන විරුදයෙන්

හඳුන්වනුයේ ද වර්තමානයේ භාවිත සියලු විෂයන් ආරම්භයේ දර්ශන විෂය යටතේ සාකච්ඡා කළ බැවිනි. පරිගණක නිර්මාණයට අවශ්‍ය ගණිත ක්‍රම පවා පෛතගරස් වැන්නන් ග්‍රීක යුගයේ භාවිත කොට තිබිණි. ඒ අනුව සියලු විෂයන්ගේ මව යනුවෙන් දර්ශනය හැඳින්වීම යුක්ති යුක්ත වන බව පැහැදිලි කරුණකි. මේ ආකාරයෙන් හඳුනාගත හැකි බටහිර දර්ශනයෙන් ලෝකයට බිහි වූ දාර්ශනික එළඹුම්හි සුවිශේෂීත්වය එක් යුගයකට පමණක් සීමා කළ හැකි නොවේ. එයට හේතු වනුයේ යුග කිහිපයක වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස සමස්ත බටහිර දර්ශනය ඇගයීම යුක්ති යුක්ත බැවිනි.

## ආශ්‍රිත ග්‍රන්ථ


අභයවංස, කපිල. (1997) **ඉමැනුවෙල් කාන්ට්ගේ ඥානවිභාගය**. කැලණිය: කැලණිය විශ්වවිද්‍යාලය, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය.

එදිරිසිංහ, දයා සහ ඥානදාස පෙරේරා. (2001) **දාර්ශනික විමර්ශන**. දෙහිවල: වත්මා ප්‍රකාශකයෝ.

කලංසූරිය, ඒ.ඩීපී. (1987) **දර්ශනය හැඳින්වීමක්**. කොළඹ: ඇම්.ඩී ගුණසේන සහ සමාගම.

කලංසූරිය, ඒ.ඩී.පී. (2007) **නූතන බටහිර දර්ශනය**, බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ජයතිලක, කේ. (2009) **දර්ශනවාද අසබඩින්**. කොළඹ 12: ප්‍රදීප ප්‍රකාශකයෝ.

ධම්මානන්ද හිමි, හෝමාගම. (2016) **''නූතන බටහිර බුද්ධිවාදී දාර්ශනිකයෝ''**, (සංස්.) ආණමඩුවේ ධම්මදස්සි හිමි සහ තවත් අය, ප්‍රබුද්ධ සිව්වන කලාපය, ශ්‍රී ලංකා පාලි ග්‍රන්ථ සමාගම.

පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ. (2003) **පෙරදිග හා අපරදිග දර්ශනය**, (පරි). (කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මෙන්දිස්, බී. සංජීව මහේෂ්. (2007) **මධ්‍යකාලීන බටහිර දර්ශනය**. නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

**යුරෝපා ඉතිහාසය**. (2009) බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

රසල්, බර්ට්‍රන්ඩ්. (1970) **බටහිර දර්ශන ඉතිහාසය**. කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

විජයතුංග, හරිශ්චන්ද්‍ර. (2006) **මහා සිංහල ශබ්දකෝෂය**. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

විදානගමගේ, කුලසේන. (1997) **දාර්ශනික ගැටලු**. නාරම්මල: කර්තෘ ප්‍රකාශන.

විදානගම, චාමලී රුවන්දිකා. (2009) **දාර්ශනික විමර්ශා**. නාරම්මල: කර්තෘ ප්‍රකාශන.

විදානගම, චාමලී රුවන්දිකා. (2011) **"ලංකාවතාර සූත්‍රගත මූලික චින්තනය", දර්ශන අධ්‍යයන**. (සංස්.) මැදගම්පිටියේ විජිතධම්ම හිමි සහ මිරිස්වත්තේ විමලඤාණ හිමි. වාද්දූව: ප්‍රවචනෝදය පිරිවෙන.

විමලරත්න, කේ.ඩී.ජී (2014) **මධ්‍යතන යුරෝපය**, බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ.

වීරවර්ධන, සුමේධ. (2008) **'සමකාලීන විශ්ලේෂී දර්ශනයේ ස්වභාවය පිළිබඳ විමසුමක්'** මාගධී ශාස්ත්‍රීය සංග්‍රහය, (සංස්.) මහමිතව පඤ්ඤාරතන හිමි සහ මැඩිල්ලේ පඤ්ඤාලෝක හිමි, නුගේගොඩ: පාලි හා බෞද්ධ අධ්‍යයන සංසදය පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,

වීරසිංහ, එස්.ජී.එම්. (1988) **කාන්ටියානු දර්ශනය පිළිබඳ විචාර පූර්වක අධ්‍යයනයක්.** කතෘ ප්‍රකාශන.

Blackburn, Simon. (2016) **Oxford Dictionary of Philosophy**. United kingdom: Oxford University press.

Burnet, j. (1971) **Early Greek Philosophy**. London: Adam and Charles Black.

Wittgenstein, L. (1953) **Philosopical investigation**. oxford: Basil Blackwell.

**https://en.wikipedia.org/wiki/Modern_philosophy 2020.05.10**.

**https://en.wikipedia.org/wiki/Renaissance 2020.05.10.**